සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**06 ශ්‍රේණිය** | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | **33 S**

නම: ............................................ | **ඉතිහාසය** | **කාලය පැය දෙකයි**

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1-5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ක්‍රි.ව 5 වන සියවසේදී රචනා වූ ................................................... මෙරට ඉතිහාසය ඉගෙනීමේදී වැදගත් වූ ග්‍රන්ථයකි.

02. ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය .................................... ලෙස හැඳින්වේ.

03. ............................................ ශිෂ්ටාචාරයට අයත් වැසියන් පළමු වරට රබර් බෝලයක් නිපදවන ලදි.

04. බුදුරජාණන් වහන්සේ ගේ දකුණු අකු ධාතුව ........................................... තැම්පත් කර ඇත.

05. ධාතුසේන රජුගේ සහෝදරයා ...................................................... නම් විය.

(සලතිස්බෝ , මහසෙන් , දීපවංශය , දාඨානාම , ක්‍රිස්තු වර්ෂ , මහාවංශය , මායා , ක්‍රිස්තු පූර්ව , ඊජිප්තු , ථූපාරාමයේ , කේශ ධාතු )

- **අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗ ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. බුදුන් වහන්සේ ගේ මහා පරිනිර්වාණය ක්‍රි.පු 544 දී සිදු විය. ( )

07. මානව පරිනාමයේ වැඩි කොටසක් සිදු වූයේ මහා හිම යුගයේ ය. ( )

08. පණ්ඩුකාභය රජු විසින් තිසා වැව කරවන ලදි. ( )

09. වසභ රජතුමා ලම්භකර්ණ වංශයේ ආරම්භක පාලකයා ය. ( )

10. විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබසින ලද්දේ දඹකොළ පටුන වරායටය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. මුස්ලිම් වරු තමන්ගේ ආගමික උත්සව පැවැත් වීමේ දී කාලය මැනීමට භාවිතා කරන වර්ෂ ක්‍රමය වන්නේ,
    i. ක්‍රිස්තු වර්ශ ii. හිජ්රි වර්ෂ iii. ක්‍රිස්තු පූර්ව vi. බුද්ධ වර්ෂ

12. අනුරාධපුර යුගයේ දී නගරයේ කම්මල් වැඩ කළ අය ඇදහූ දෙවියන් වන්නේ,
    i. ස්කන්ධ කුමාර ii. සුමන සමන් iii. කම්මාරදේව vi. විභීෂණ

13. මහා හිම යුගයේ ජීවත් වූ සත්ත්වයෙකි,
    i. උරගයන් ii. මැමත් iii. ක්ෂීරපායීන් vi. බැටලුවන්



LIVEWORKSHEETS

14. දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය පාලන සමයේ ඉන්දියාවේ පාලකයා වූයේ ,

i. බිම්බිසාර රජ    ii. අජාසත්ත රජු    iii. ධර්මාශෝක රජු    vi. සුද්ධෝදන රජු

15. දුටුගැමුණු රජතුමා බලයට පත්වීමට ප්‍රථම අනුරාධපුරය පාලනය කළ පාලකයා,

i. එළාර රජු    ii. කාවන්තිස්ස රජු    iii. සද්ධාතිස්ස රජු    vi. වසභ රජු

**• අංක 16 -20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති හිස්තැන මත ලියන්න.**

16. අතීතයේ දිගාමඩුල්ල යන ප්‍රදේශය වර්තමානයේ හඳුන් වන්නේ.......................................... යනුවෙනි.

17.මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පහත්ම පන්තිය ....................................... විය.

18.ජේතවයනාරාම දාගැබ තුළ බුදුරජාණන් වහන්සේගේ ............................................... නිධන් කොට ඇතැයි විශ්වාස කෙරේ.

19.ධාතුසේන රජතුමා විසින් අනුරාධපුරයේ ................................................ දානශාලාව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ බව සඳහන් වේ.

20. .............................................. ඇළ වසභ රජතුමාගේ නිර්මාණයකි.

(ල: 20x2=40)



LIVEWORKSHEETS